සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

මගේ අංකය DSD/HO/14/SS/05/01/04/2023
எனது இல ..................
My No

ඔබේ අංකය
உமது இல ..................
Your No

දිනය 2023.02.06
திகதி ..................
Date

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් /සහකාර අධ්‍යක්ෂවරුන්.

**සමෘද්ධි, වැඩිහිටි,විශේෂ හැකියා ඇති පුද්ගලයින්ගේ හා වකුගඩු රෝගීන්ගේ දීමනා සහ එම ආධාර වැඩසටහන යටතේ පොරොත්තු ලේඛන ගත ප්‍රතිලාභීන්ට ගෙවනු ලබන වැඩි කරන ලද දීමනා අඛණ්ඩව ලබාදීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් වෙත යොමු කරන ලද DSD/HO/14/SS/05/ 01/ 04/ 2023 සමාංක හා 2023.02.02 ලිපි හා බැඳේ.

02. DSD/HO/14/SS/05/ 01/ 04/ 2023 සමාංක හා 2023.02.02 ලිපියේ 03 ඡේදයේ සඳහන් නිර්දේශ ලබා ගැනීමේදී වැඩිහිටි පුද්ගලයන්ට අදාල දීමනා සඳහා නිර්දේශ ලබා ගැනීම, ප්‍රථමයෙන් වැඩිහිටි නිලධාරීන් විසින් සිදු කළ යුතුය. එමෙන්ම විශේෂ හැකියාවන් ඇති පුද්ගලයන් හා නිදන්ගත වකුගඩු රෝග වලින් පෙළන පුද්ගලයන් සඳහා අදාල මුලික නිර්දේශ ලබා ගැනීම සමාජ සේවා නිලධාරීන් සිදු කළ යුතුය. ඉන් අනතුරුව අප දෙපාර්තමේන්තුවේ බැංකු කළමණාකරු, මුලස්ථාන කළමණාකරුගේ නිර්දේශ සහිතව බැංකු මට්ටමින් එම නිර්දේශ ලබා ගැනීමට කටයුතු සිදු කළ යුතු වේ.

03. තවද 2023 ජනවාරි මසට අදාලව වැඩිහිටි, ආබාධිත හා නිධන්ගත වකුගඩු රෝගීන්ට අදාල පොරොත්තු ලේඛන හා අතිරේක දීමනා වලට අදාල සමෘද්ධි බැංකු මට්ටමින් සකසක ලද වාර්තා මේ වන විට අප දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇත. එම වාර්තා වල මෘදු පිටපත් ක්ෂුද්‍ර මුල්‍ය අංශය මඟින් ඔබ වෙත එවීමට මේ වන විටත් කටයුතු යොදා ඇත.

04. ඒ අනුව ඔබ දිස්ත්‍රික්කයට අදාලව සකස් කරන ලද එම වාර්තා ඉහත සඳහන් පරිදි අදාල ආයතන වල නිලධාරීන්ගේ සහයෝගයෙන් සමෘද්ධි බැංකු මට්ටමින් නිර්දේශ ලබාගෙන දිස්ත්‍රික් මට්ටමින් සකසන වාර්තා ඔබගේ අත්සනින් යුතුව ක්ෂුද්‍ර මුල්‍ය අංශයට විද්‍යුත් තැපැල (mfdyear2018@gmail.com) මඟින් එවීමට කටයුතු කළ යුතුය.

05. එමෙන්ම පෙබරවාරි, මාර්තු හා අප්‍රේල් මාස වලට අදාලව පොරොත්තු ලේඛන ගත දීමනා,අමතර දීමනා සහ ඒ ඒ බාණ්ඩ වලට හිමි නිත්‍ය දීමනා ද, සමෘද්ධි බැංකු හරහා ලබාදීමට නියමිතය. එසේ හෙයින් දැනට ලබාදී ඇති උපදෙස් පරිදි පෙබරවාරි මස සිට ඊට අදාල වාර්තා ඉහත උපදෙස් ප්‍රකාරව ක්ෂුද්‍ර මුල්‍ය අංශයට එවීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:- 1.ලේකම්,කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
2. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි. හා අ.ක.ස
3.අධ්‍යක්ෂ ක්ෂුද්‍ර මුල්‍ය ,සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.අ.ක.ස
4. අධ්‍යක්ෂ (මහා සංගම්),සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.අ.ක.ස
5. අධ්‍යක්ෂ, වැඩිහිටි මහ ලේකම් කාර්යාලය - කා.අ.ක.ස.
6. අධ්‍යක්ෂ, ආබාධ සහිත පුද්ගලයන් සඳහා වු ජාතික මහ ලේකම් කාර්යාලය - කා.අ.ක.ස.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මුල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 28877 |